# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයන**

**සංවර්ධන අධ්‍යයනයේ ස්වභාවය - DVST 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'සංවර්ධන අධ්‍යයනය' පුළුල් ලෙස හැදෑරිය යුතු විෂය ක්ෂේත්‍රයක් වන්නේ මන්දැයි උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

02. සංවර්ධනය බහුමානීය සංකල්පයක් බව තෝරාගත් නිර්වචන පහක් (05) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. යහපත් ජීවන තත්ත්වයක් අත්කරගැනීම සඳහා සපුරාගත යුතු මිනිසුන්ගේ "ජීවවිද්‍යාත්මක අවශ්‍යතා" (Biological Needs) සහ "සංස්කෘතික උවමනා" (Cultural Wants) පෙන්වා දෙන්න. (ලකුණු 20)

04. සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල් හඳුනාගැනීමේ දී යොදාගත හැකි නිර්ණායක පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. ලෝක ජනසංඛ්‍යා ගැටළුවෙහි හඳුනාගත හැකි ප්‍රවණතා හතරක් (04) උචිත උදාහරණ ඇසුරෙන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

06. රටක සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට දේශීය මානව සම්පත් යොදාගත හැකි ආකාරය උචිත උදාහරණ තුනක් (03) මගින් විස්තර කරන්න. (ලකුණු 20)

07. සැම දෙනාටම වඩාත් යහපත් ජීවිතයක් සකස්කිරීමේ දී තිරසාර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාවට නැංවීමේ වැදගත්කම ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) පැහැදිලි කරන්න.

    i. මානව සංවර්ධන දර්ශකය (Human Development Index)
    ii. ග්‍රාමීය සංවර්ධනය (Rural Development)
    iii. යැපුම් න්‍යාය (Dependency Theory)
    iv. යහ රාජ්‍ය පාලනය (Good Governance) (ලකුණු 10x2=20)

***********************************